# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/148/2024 (PSC)**

එස්.ඩී.ආර්.ආර්.අබේසේකර
**අභියාචක**

**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.04.02**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක වී.ජී.ගුණසිංහ මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ජේ.එම්.දිසානායක මහත්මිය.

**-<u>නියෝගය</u>-**

එස්.ඩී.ආර්.ආර්.අබේසේකර යන අය විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2024.09.04 වන දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා තුනට අදාළව ලබා දී ඇති දඬුවම ඉවත් කර, ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙසයි. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා තුන පහත දැක්වේ.

*01. මහර බන්ධනාගාරයේ කොරි අංශයේ ගබඩා අංශයේ සේවය සඳහා යොදවා සිටි ඔබ 2021.08.30 වන දින ප්‍රධාන බන්ධනාගාරයේ ප්‍රධාන දොරටුවට පැමිණ උඩු මහල වෙත ගොස් එම පරිශ්‍රය පවිත්‍රතා කටයුතු සඳහා යොදවා සිටි සිර අංක G-18180 ඉන්දික රුවන් නැමැති සිරකරු හමුවී තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ඔහු වෙත ලබා දීමෙන් සිරකරුට තහනම් ද්‍රව්‍ය හඳුන්වාදීම, හා සිරකරු සමඟ නුසුදුසු සම්බන්ධතා පැවැත්වීමත් ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පලමු උපලේඛනයේ 15 වන වගන්තිය සමඟ ගැනෙන බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණපනත් 155 (4) (9) සහ (19)*

*සමඟ කියැවෙන බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202 (VIII) "ඒ'' සහ (IX) "බී'' වගන්තිය උල්ලංඝණය කිරීම.*

02. *කොරි අංශයේ රාජකාරි සඳහා යොදවා සිටි ඔබ 2021.09.08 වන දින මහර බන්ධනාගාරයේ ඇතුලත කර්මාන්ත අංශය වෙත පැමිණ එහි වැඩ සඳහා යොදවා සිටි සිර අංක* E-*28587 ජේ.විජේසිරි යන සිරකරු වෙත තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ලබාදීමෙන් සිරකරුට තහනම් ද්‍රව්‍ය හඳුන්වාදීම හා සිරකරු සමඟ නුසුදුසු සම්බන්ධතා පැවැත්වීම ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ* XLVIII *පරිච්ඡේදයේ පලමු උපලේඛනයේ 15 වන වගන්තිය සමඟ ගැනෙන බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණපනත් 155 (4) (9) සහ (19) සමඟ කියැවෙන බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202* (VIII) *"ඒ'' සහ* (IX) *"බී'' වගන්තිය උල්ලංසනය කිරීම.*

*03. ඔබ 2021.08.30 වන දින සිර අංක* G-*18180 ඉන්දික රුවන් නැමැති සිරකරු හමුවී තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ඔහු වෙත ලබාදීමත් සහ 2021.09.08 වන දින ඇතුලත කර්මාන්ත අංශය වෙත පැමිණ සිර අංක* E-*28587 ජේ.විජේසිරි යන සිරකරු වෙත තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ලබාදී එම පාර්සල් බන්ධනාගාරයේ* D *විශේෂ අංශයේ රඳවා සිටින සිර අංක X-8287 මිතුන් මනෝජ් නොහොත් ශෙහාන් සිරකරු වෙත ලබාදෙන ලෙසට ඉහත සිරකරුවන්ට උපදෙස් ලබාදීමෙන් බන්ධනාගාරය තුලට තහනම් ද්‍රව්‍ය හඳුන්වා දීමත් සිරකරුවන් අනුමත නොවන වැඩ සඳහා යොදවා ගැනීමත් ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ* XLVIII *පරිච්ඡේදයේ පලමු උපලේඛනයේ 15 වන වගන්තිය හා ගැනෙන බන්ධනාගාර ව්‍යවස්ථාපිත අණපනත් 155 (4) (9) සහ (19) සමඟ කියැවෙන බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 202* (VIII)*"ඒ'' සහ* (IX) *"බී'' වගන්තිය උල්ලංසනය කිරීම.*

ඉදිරිපත් කර තිබූ ප්‍රථම චෝදනා දෙක පදනම් කරගෙන ඇත්තේ, අභියාචක විසින් ඉන්දික රුවන් සහ ජේ.විජේසිරි යන සිරකරුවන් දෙදෙනා වෙත, තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සල් දෙකක් ලබා දුන්නේ යැයි කියනු ලබන කරුණ මතයි. III වන චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ, ඉහත සඳහන් සිරකරුවන් දෙදෙනා මඟින් මනෝජ් නොහොත් ෂෙහාන් යන සිරකරුට එකී තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සල් ලබා දීමට කටයුතු කර තිබුනාය යන කරුණ මතය. එකී චෝදනා මත පවත්වන ලද විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව, එකී සියළුම චෝදනාවලට අභියාචක වරදකරු බවට පත් කර ඇත. ඉන් අනතුරුව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් අභියාචක වෙත යවන ලද,

2023.09.08 දිනැති ලිපිය මඟින් විනය දඬුවමක් පනවා ඇත. එම විනය දඬුවම වන්නේ, අභියාචක සාමාන්‍ය අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා තිබීමයි. එකී විනය දඬුවමට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර එකී අභියාචනය නිශ්ප්‍රභා කරමින්, ඒ බව දැන්වීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024.08.08 දිනැති ලිපිය අභියාචක වෙත නිකුත් කර ඇත.

අභියාචකගේ ඉල්ලීම වන්නේ, ඔහු වෙත නිකුත් කර ඇති ඉහත සඳහන් අකාර්යක්ෂමතාවය හේතුවෙන් විශ්‍රාම ගැන්වීම යන නියෝගය ඉවත් කර ඔහුව නැවත සේවයේ පිහිටුවන ලෙසයි. එම ඉල්ලීම සළකා බැලීම සඳහා අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ විනය පරීක්ෂණයෙන් අනතුරුව ගෙන තිබූ තීරණයෙහි නිරවද්‍යතාවය සළකා බැලිය යුතුය.

අභියාචකට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය සඳහා සාක්ෂිකරුවන් 18 දෙනෙකුගේ සාක්ෂි සටහන් කරගෙන ඇත. චෝදනාවන්හි නම් සඳහන් ඉන්දික රුවන් සහ ජේ.විජේසිරි යන සිරකරුවන් දෙදෙනාගේ සාක්ෂිද ඒ අතර වේ. ඉන්දික රුවන් යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු විසින් රංග ලෙසින් හඳුනාගෙන ඇති, ස්ටෝර්රුවේ ඉන්න මහතා ඔහුට ඇන්විලොප් එකක් ගෙනත් දුන් බවයි. එම භාණ්ඩය කලිසම් සාක්කුවේ දාගෙන ටොයිලට් එකට ගොස් කඩා බැලීමේදී එහි ෂොපින් එකක ගැටගැසූ ගුලි තුනක් තිබුන බවට ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. විජේසිරි යන සිරකරු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ, ඔහු ඊට පෙර නොදැකපු උස මහත තට්ටය සහිත, උරහිසේ SK කියලා ගසා ඇති මහත්තයෙක් පැමිණ බ්‍රවුන්පේපර් බෑග් එකක ඔතපු පාර්සලයක් D සෙල් එකේ ඉන්න ෂෙහාන්ට දෙන්න කියලා ඔහුට දුන් බවයි. අනතුරුව ඔහු විසින් එය ධනුෂ්ක යන සිරකරුට දෙමින් එය ෂෙහාන් වෙත ලබා දීමට පැවසූ බවත් ඔහු වැඩි දුරටත් පවසා ඇත. අනතුරුව ඔහු විසින් ධනුෂ්කගෙන් මේ බව විමසීමේදී එම පාර්සලයේ හෙරොයින් තිබූ බවට ධනුෂ්ක ඔහුට පැවසූ බවට සාක්ෂි දෙමින් සඳහන් කර ඇත. ඉන්දික රුවන් යන අය රංග ලෙසින් හඳුනා ගෙන ඇත්තේ සහ විජේසිරි යන අය විසින් SK සහිත ලාංඡනය උරහිසෙහි පැළඳ සිටි අය ලෙසට හඳුනා ගෙන ඇත්තේද මෙම අභියාචකය. අභියාචක රංග වශයෙන් හඳුන්වන බව සියළුම සාක්ෂිවලින්ද හෙළිදරව් වේ.

සැරයන් එදිරිසිංහ යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු විසින් විජේසිරි සහ ධනුෂ්ක යන අයගෙන් ප්‍රශ්න කළ බවත්, ඔවුන්ගෙන් ප්‍රශ්න

කිරීමේදී ප්‍රශ්නගත ද්‍රව්‍ය ගෙනත් දුන්නේ SK ලාංඡනය පැළඳි මහත්වරු දෙදෙනෙක් බවත්, එයින් එක් අයකු ලෙස අභියාචක හඳුනාගත් බවටත් එම සිරකරුවන් දෙදෙනා විසින් සාක්ෂි දෙමින් පවසා ඇත. මනෝහර නිශ්ශංක යන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, මෙම තහනම් ද්‍රව්‍ය ලබා දුන්නේ රංගන මහතා බවට තහවුරු වූ බවයි.

නියාමක කුමාර යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු විසින් රැඳවියන් දෙදෙනෙකු ගෙන්වා ප්‍රශ්න කිරීම් සිදු කළ බවත්, එම ප්‍රශ්න කිරීම් වලදී හෙරොයින් පාර්සලය විජේසිරි යන සිරකරුට ගෙනත් දුන් බව ඔවුන් විසින් ඔහුට ප්‍රකාශ කළ බවත්ය. ඉන්දික යන සිරකරු, කබඩ් එකක් තුළ තිබී ගන්නා ලද පාර්සලයක් ජයශාන්ත යන ජේලර් වෙතට ලබා දුන් බවටද ඔහු විසින් ප්‍රකාශ කර ඇත. තවද ඉන්දික යන අය ඔහුට පවසා ඇත්තේ, SK යනුවෙන් පැළඳගත් මහතා, රංග මහතා බව ඔහු දන්නා බවත්ය. සංජීව කුමාර යන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, 2021.09.08 වන දින රංග මහතා, විජේසිරි යන සිරකරුවකු ගැන ඔහුගෙන් විමසූ බවයි. එම තත්ත්වය බුද්ධික හසිඳු යන සාක්ෂිකරු විසින්ද පවසා ඇත. එක් එක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි එකිනෙකට ගැලපෙමින් තහවුරු වී ඇත.

එල්.හෙට්ටිආරච්චි යන සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ, ඉන්දික කියන සිරකරුව විනය අංශයේ නිළධාරීන් සමඟ ඉහළ කාර්යාලය වෙත රැගෙන ආ බවත්, එම සිරකරු විසින් කබඩ් එකේ ලාච්චුව ඇරලා මොනවහරි දෙයක් විනය අංශයේ ජේලර් මහතා වන ජයශාන්ත මහතාට ලබා දුන් බවත්ය. ප්‍රියන්ත පුෂ්පකුමාර නැමැති සාක්ෂිකරු පවසා ඇත්තේ, රංග මහතා ඔහුව ප්‍රධාන ජේලර් මහතාගේ කාමරයට කැඳවා, මෙම සිද්ධියට අදාළ විජේසිරි සහ ඉන්දික යන අයගෙන් විමසූ අවස්ථාවේදී, ඔවුන් විසින් රංගන යන අය හඳුනාගනිමින්, ඔහු අභියාචක බවට හඳුනා ගෙන ඇත. සාක්ෂි ලබා දී ඇති ඉතිරි සාක්ෂිකරුවන්ද මෙම කරුණ තහවුරු කරමින් සාක්ෂි ලබා දී ඇත.

එම සාක්ෂි හරස් ප්‍රශ්න වලින් බිඳ හෙළීමට සමත් වී නැත. මේ අනුව පෙනී යන්නේ, ඉන්දික සහ විජේසිරි යන සිරකරුවන් දෙදෙනා වෙත කිසියම් පාර්සලයක් අභියාචක විසින් ලබා දී ඇති බව තහවුරු කිරීම සඳහා ඉතාමත් විශාල සාක්ෂි ප්‍රමාණයක් ඉදිරිපත්ව ඇති බවයි. සාක්ෂිකරුවන් සියළුම දෙනාගේ සාක්ෂි සමූහයක් ලෙස සළකා බලන විට, අභියාචක වෙත ඉදිරිපත් කර ඇති චෝදනාවන්හි සඳහන් කරුණු පැහැදිලිව ඔප්පු වී ඇති බව පෙනී යයි. ඒ අනුව

විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවලට ඔහු වරදිකරු බවට පත්කිරීමේ දෝශයක් පෙනෙන්නට නැත.

මෙම අභියාචනය, විනිශ්චය අධිකාරය ඉදිරියේ විමසීමට ගත් අවස්ථාවේදී අභියාචක වෙනුවෙන් කරුණු දක්වමින් පවසා ඇත්තේ, චෝදනාවල සඳහන් පාර්සලය විනය පරීක්ෂණයට ඉදිරිපත් නොවීම නිසා අභියාචක චෝදනාවලට වැරදිකරු බවට පත් කළ නොහැකි බවයි. තවද චෝදනාවන්ට අනුව එම පාර්සලයේ අඩංගු ද්‍රව්‍ය තහනම් ද්‍රව්‍යයක් ලෙස සඳහන්ව ඇති නිසා, එම තහනම් ද්‍රව්‍ය විනය පරීක්ෂණයේදී ඉදිරිපත් නොකිරීම මත, අභියාචක නිදහස් කළ යුතු බවටද කරුණු ඉදිරිපත් කර ඇත. එම තත්ත්වය තහවුරු කිරීම සඳහා බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කර ඇති අංක 30/2008 සහ 2018.07.07 දිනැති ලේඛනයක් ඉදිරිපත් කර ඇත. එම ලේඛනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් සියළුම බන්ධනාගාර නිළධාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත යවන ලද උපදෙස් අඩංගු චක්‍රලේඛයකි. එහි සඳහන් වන්නේ, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් චෝදනා නැගීමට නම් එම ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය බැව් සනාථ කරගත යුතු බවයි. එහි තවදුරටත් සඳහන් වන්නේ, මත්ද්‍රව්‍ය සම්බන්ධව රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලබා දෙනු ලබන වාර්තාවේ සහතිකයක්ද, චෝදනා ගොනු කිරීමට පෙර ලබා ගත යුතු බවයි. මෙම අවස්ථාවේදී, රජයේ රසපරීකක්‍ෂකවරයාගේ වාර්තාවක්, විධිමත් විනය පරීක්ෂණයේදී ඉදිරිපත් කර නැත. එම තත්ත්වය යටතේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති චෝදනාවලින් ඔහු නිදහස් කළ යුතු බවට අභියාචක වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහත කී 2008.07.07 දිනැති චක්‍රෙල්ඛ ලිපිය මඟින් බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත කිසියම් පරිපාලනමය නියෝගයක් නිකුත් කර ඇත. එම නියෝගය අනුව කටයුතු නොකිරීම මතම, කිසියම් පුද්ගලයකුට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනාවලින් ඔහුව නිදහස් කළ යුතුද යන්න මෙහිදී සළකා බැලිය යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් පරීක්ෂා කර බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විනිශ්චය අධිකාරය විසින් දන්වා සිටින ලදී. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද, 2026.01.16 දිනැති වාර්තාවේ සඳහන් වන්නේ, විධිමත් විනය පරීක්ෂණයෙහි පැ 08 වශයෙන් සළකුණු කර ඇති, රාගම පොලිස්

ස්ථානාධිපති විසින් බන්ධනාගාර අධිකාරී වෙත යවන ලද 2021.10.07 දිනැති ලිපියට අනුව අදාළ භාණ්ඩ රාගම පොලිස් ස්ථානයේ සේවය කළ උප පොලිස් පරීක්ෂක බවන්ත රාජකරුණා සහ උප පොලිස් පරීක්ෂක වානක යන අය විසින් භාර ගෙන ඇති බවයි. අනතුරුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා, රාගම නගරයේ තිබූ සෙබා ගෝල්ඩ් හවුස් ආයතනයෙන් එම භාණ්ඩ කිරා බැලීමෙන් අනතුරුව ලබා ගන්නා ලද වාර්තාවේ, එහි තිබූ හෙරොයින් ප්‍රමාණය මිලිග්රෑම් 2475 බවට අනාවරණය වූ බවට එහි සඳහන් වේ. අනතුරුව එම හෙරොයින් ප්‍රමාණය පොලිස් ස්ථානයට රැගෙන විත් අංක 911/21 යටතේ, නඩු භාණ්ඩයක් ලෙස ස්ථානයට ඉදිරිපත් කරන ලද බවට එහි වැඩිදුරටත් සඳහන් වේ.

ඉහත සඳහන් කරුණු වලින් පැහැදිලි වන්නේ හෙරොයින් යැයි කියනු ලබන පාර්සලයක් මෙම සිද්ධියට අදාළව රාගම පොලිස් ස්ථානාධිපතිගේ නියෝග මත පොලිස් ස්ථානයට භාර දී ඇති බවයි. එම පාර්සලයේ අඩංගු ද්‍රව්‍ය හෙරොයින්ද යන්න තහවුරු කර ගැනීම සඳහා රජයේ රසපරීක්ෂක වාර්තාවක් ඉදිරිපත් කර නැත. කෙසේ වෙතත් කිසියම් ද්‍රව්‍යයක් අඩංගු පාර්සලයක් මෙම සිද්ධිය නිසා බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයට ලබා ගෙන ඇත. එම පාර්සලය ඉන්දික සහ විජේසිරි යන අයට ලබා දී ඇත්තේ, අභියාචක විසින් බව, ඉතාමත් පැහැදිලි සාක්ෂිවලින් සනාථ වී ඇත. තවද විජේසිරි යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහු වෙත ලැබුණු පාර්සලයෙන් කොටසක් ඔහු පාවිච්චි කළ බවත්, එහි අඩංගුව තිබුණේ හෙරොයින් බවටත්ය. ඒ ආකාරයෙන් ඔහු පැවසුයේ, ඉන් පෙර ඔහු විසින් හෙරොයින් පානය කර ඇති පලපුරුද්ද නිසා බවටද ඔහු විසින් වැඩිදුරටත් සාක්ෂි දී ඇත.

හුවමාරු වී ඇති පාර්සලයෙහි හෙරොයින් යන විෂ මත්ද්‍රව්‍ය අඩංගු නොවුනත්, අදාළ පාර්සල් සිරකරුවන් වෙත ලබා දෙමින් අභියාචක බන්ධනාගාර නිලධාරියකු වූ අභියාචක විසින් එලෙස කටයුතු කර තිබීම බලවත් වරදකි. ඉදිරිපත් කර ඇති චෝදනාවන්හි, තහනම් ද්‍රව්‍ය අඩංගු පාර්සලයක් ලබා දීම යන කරුණට අමතරව, සිරකරු සමඟ නුසුදුසු සබඳතා පැවැත්වීම යන චෝදනාද ඉදිරිපත් කර ඇත. එම චෝදනාව ඔප්පු කිරීම සඳහා බොහොමයක් සාක්ෂි දක්නට ඇත. එවැනි තත්ත්වයක් යටතේ විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව ගෙන ඇති තීරණය, දෝෂ සහගත බවට තීරණය කළ නොහැක.

තවද මෙම සිද්ධිය හේතුවෙන්, අභියාචක ඉතාමත් බරපතල වරදකට වරදකරු වී ඇති බව පෙනී යන නිසා ඔහු වෙත දැනට ලබා දී ඇති දඬුවම අධික නොවන බව පෙනී යයි. අභියාචක සේවයෙන් පහ කිරීමකට හෝ යටත් කර නැත. එවැනි තත්ත්වයක් යටතේ, මෙම කරුණට විෂය වූ පාර්සල් වල හෙරොයින් නැමැති මත්ද්‍රව්‍ය තිබූ බවට පැහැදිළි සාක්ෂි නැතත්, ඉදිරිපත් වී ඇති සියළු කරුණු සළකා බැලීමේදී අභියාචක වෙත නිකුත් කර ඇති දඬුවම, ඒ ආකාරයෙන් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මැදිහත් වීමට විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත.

ඉහත හේතූන් සළකා බලා අභියාචක වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/